www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බ්‍රිතාන්‍යය ද ග්‍රීසියේ වැනි තත්වයකට මුහුනපෑමේ හැකියාව ගැන යුරෝපීය සංගමය අනතුරු අඟවයි

## Britain faces a possible Greek scenario, European Union warns

**ක්‍රිස් මාස්ඩන් විසිනි**

2010 මාර්තු 22

කප්පාදු පිලිවෙත් තීව්‍ර නොකලහොත්, ග්‍රීසියේ වැනි තත්වයකට බ්‍රිතාන්‍ය ආන්ඩුවට ද මුහුනපෑමට සිදුවනු ඇතැයි යුරෝපා කොමිසම අනතුරු අඟවා ඇත.

ගෝර්ඩන් බ්‍රවුන්ගේ කම්කරු ආන්ඩුව රාජ්‍ය නයගැතිකම අඩුකිරීමට අවශ්‍ය තරම් ප්‍රමානයක දැඩි කප්පාදුවක් යෝජනා කර නොමැති හෙයින් බ්‍රිතාන්‍යයේ ඒඒඒ වර්ගීකරනය අනතුරට ලක්ව ඇතැයි යුරෝ කොමසාරිස්වරු වාර්තාවක් මගින් ප්‍රකාශ කර තිබේ. පවුම් බිලියන 178 කට වැඩි, එනම් දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 12 ක්ව පවතින බ්‍රිතාන්‍යයේ අයවැය හිඟය ග්‍රීසියේ හිඟයට සමානුපාතික වන අතර මූර්ත අගය අතින් ඊට වඩා බෙහෙවින් අධිකය.

2014 වන විට ආන්ඩුවල අයවැය හිඟයන් දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3 කට වඩා පහතට ගෙනඒම යුතුය යන යුරෝපා සංගමයේ නියමයට අනුකූලව තම හිඟය සීමාකිරීමේ මගට එක්සත් රාජධානිය තවමත් පැමින නැති බවට වාර්තාව මැසිවිලි නගයි. බ්‍රිතාන්‍ය යුරෝ කලාපය තුල නොසිටිය ද යුරෝපීය ආර්ථිකය මත දැඩි ලෙස රැඳී සිටියි.

කම්කරු පක්ෂය විසින් අයවැය ලේඛනයට පෙරාතුව නිකුත් කරන ලද වාර්තාව පවුම් බිලියන 19 ක් කපා හැරීමේ සැලසුම් නිවේදනය කලේය. එමගින් 2015 වසර වන විට එක්සත් රාජධානියේ අයවැය හිඟය සියයට 4.7 ක් දක්වා පහත වැටෙනු ඇතැයි එම වාර්තාවෙන් කියවින. ඉන්පසුව නිර්දේශ කර ඇති පරිදි පවුම් බිලියන 20 ත් 25 ත් අතර ප්‍රමානයකින් කෙරෙන අමතර කප්පාදුවල සංඛ්‍යා ආන්ඩුව විසින් ඉදිරිපත් කර තිබේ.

"රාජ්‍ය මූල්‍ය දැරිය හැකි මට්ටමකට ගෙන ඒම සඳහා විශ්වාස කලහැකි කාල රාමුවකට අනුව වර්තමානයේ සැලසුම්කර ඇති මූල්‍යමය සීමාකිරීමේ පියවර වලින් ඔබ්බට අමතර පියවර ගැනීම අවශ්‍ය වනු ඇතැයි" යුරෝපා කොමිසමේ වාර්තාව කෙලින්ම ප්‍රකාශ කර තිබේ.

2010-2011 වසර සඳහා සියයට 2 ක ආර්ථික වර්ධනයක් ද ඉන්පසු වසර හතර පුරා වසරකට සියයට 3.3 ක ආර්ථික වර්ධනයක් ද පිලිබඳ එක්සත් රාජධානියේ භාන්ඩාගාරය විසින් පලකරන ලද අනාවැකි මේ වාර්තාවෙන් ප්‍රශ්නයට බඳුන් කරයි. යුරෝපීය නිලධාරියෙක් බීබීසී සේවයට මෙසේ පැවසීය. "සිය ආර්ථික ප්‍රතිප්‍රාප්තියේ හැකියාව පිලිබඳව බ්‍රිතාන්‍ය පමනට වඩා ශුභවාදීය. අප සිතනවාට වඩා ඉක්මනින් මින් ගැලවිය හැකි යයි බ්‍රිතාන්‍ය කල්පනා කරයි."

ඩොලරයට සාපේක්ෂව ස්ටර්ලින් පවුම මාස දහයකට පසුව එහි පහතම අඩියට එනම් ඩොලර් 1.50 න් පහලට 1.4977 දක්වා වැටීමත් සමග ම ආරම්භයේදී වෙලඳපොලවල් පවුම් අලෙවි කිරීම මගින් ඊට ප්‍රතිචාර දැක්වීය. අපේක්ෂිත ප්‍රමානයට වඩා යහපත්වූ නිවාස වෙලඳපොල දත්ත හමුවේ පවුම යලි ඉහල නැගි නමුත් එය මේ වසර තුල ඩොලරයට සාපේක්ෂව සියයට 7 ක දුබලවීමෙන් පසුව පවුම වඩාත් අයහපත් ලෙස ක්‍රියාත්මක වන ව්‍යවහාර මුදල බවට පත්ව තිබේ.

"1992 වසරේදී පවුමට ඔට්ටු ඇල්ලූ ජෝර්ජ් සොරෝස් ඩොලර් බිලියනයක් උපයාගත් අවස්ථාවේ මෙන් අට ගුනයකින් වැඩි ලාභ උපදවන ඉදිරි ගනුදෙනු අභිබවා යමින් ඩොලරයට සාපේක්ෂව පවුමට අල්ලන ඔට්ටු දුර්වල වීමත් සමග පවුම සම්බන්ධ ඉදිරි ගනුදෙනු කරුවෝ පවුම් අලෙවිය සඳහා පෙර දක්නට නොලැබුන තරමේ තදියමකින් පසුවෙති." යනුවෙන් බ්ලූම්බර්ග් මාධ්‍ය තුලින් පෙන්වා දුන්නේය.

එවන් සමපේක්ෂන, බිඳවැටුනු බැංකු වලට සහන සලසමින් මුදල් පොම්ප කිරීම වෙනුවෙන් ආන්ඩු විසින් දරන ලද වියදම, කම්කරු පන්තිය මතින් පියවා ගැනීමට සැලැස්වීම සඳහා ද සිය අවශ්‍යතාවලට අනුව ආර්ථික හා සමාජ ජීවිතයේ වඩාත් පොදු සහ දිගුකාලීන ප්‍රතිව්‍යුහකරනයක් සඳහා ගෝලීය මූල්‍ය සම්පාදකයන්ගේ නොසංසිඳුවිය හැකි ඉල්ලීම්වල ද

ප්‍රකාශනයක් පමනි. අසංරෝධිත සමපේක්ෂනය හේතු කොට ගෙන අසාර්ථකවූ මූල්‍යායතන වලට මුක්කු ගැසීම සඳහා හිස් කරන ලද රාජ්‍ය භාන්ඩාගාර යලි පිරවීමට වැඩකරන ජනතාවගේ කර මතින් මිලියන ගනනින් සූරාගැනීම ඔවුන්ගේ අභිලාශය වන්නේය.

මෙය කිරීම සඳහා අත්‍යවශ්‍ය පොදු සේවා අතුගා දමමින්, දශ ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් විරැකියාවට ඇද දැමීමට හෝ ඔවුන් දරිද්‍රතා වැටුප් මට්ටම්වලට ඇද දැමිය යුතුයි. බරපතල ලෙස නයගැතිවී සිටිතැයි ආන්ඩු හෙලා දකින අතර ඒවා මිලයට ගෙන ඇති බැඳුම්කර මත පොලී අනුපාතික ඉහල නැංවීම තුලින් බිලියන ගනන් උපයාගනිමින් නැවත වරක් ඔවුහු තමන්ගේ මුදල් පසුම්බි පුරවා ගනිති. ඒඒඒ නය වර්ගීකරනය ඉවත්කර ගැනීම, බැංකුවලින් නය ගැනීමේ පිරිවැය ඉහල නංවයි. මේ බැංකු මුදා ගන්නා ලද්දේ එම ආන්ඩු විසින් ම ය. මේ තත්වය සියලුම රටවල් බංකොලොත් කිරීමේ තර්ජනය එල්ල කරයි.

සෑම රටකම දේශපාලන න්‍යායපත්‍රය හසුරුවන උත්සුකතාවයෝ මේවාය.

යුරෝපා කොමිසමේ වාර්තාව ආන්ඩුව විසින් සලකන ලද්දේ, අනතුරු ඇඟවීමකට වඩා තර්ජනයක් ලෙසය. ඒ මහ මැතිවරනයක් ඉදිරියේ එන තත්වයක් තුල එය නිකුත්වීම හේතුකොට ගෙනය. මහ මැතිවරන දිනය මෙතෙක් ප්‍රකාශයට පත්කොට නැති නමුත් සමහර විට එය මැයි 06 දිනට යෙදෙනු ඇත. අවශ්‍ය කප්පාදුවේ පරිමානය පිලිබඳව වංක වීම ගැන තත්වාරක්ෂක කොන්සවේටිව් පාක්ෂිකයෝ ආන්ඩුව හෙලා දකිති.

"ආර්ථික ප්‍රතිප්‍රාප්තියට තල්ලුව සැපයීම සඳහා අපගේ වාර්තාගත අයවැය හිඟය වඩාත් ඉක්මනින් අඩුකිරීමට අවශ්‍ය බවට කොන්සවේටිව් පාක්ෂිකයන් තර්ක කරන්නේ" යයි භාරකාර කැබිනට්ටුවේ මුදල් ඇමති ජෝර්ජ් ඔස්බෝන් කියා සිටියේය.

දුෂ්කර තීන්දු ගැනීම පසුවට කල් තබන කම්කරු ආන්ඩුවක් හා "වැඩට බැසීමට සූදානම්ව සිටින" කොන්සවේටිව් ආන්ඩුවක් අතර තෝරා ගැනීමකට ඡන්ද දායකයන් මුහුන දී සිටින බව ටෝරි පක්ෂ නායක ඩේවිඩ් කැමරොන් කියා සිටියේය.

විශ්වාසය ගොඩනැඟීමට නම් පක්ෂ, තමන් සීමාකිරීමට අපේක්ෂා කරන අංශ පෙන්නුම් කිරීම අවශ්‍ය වනු ඇතැයි ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී භාන්ඩාගාර ප්‍රකාශක වින්ස් කේබල් කියා සිටියේය.

කොන්සවේටිව් පක්ෂය සැලසුම් කරන ලද අයවැය කප්පාදු නිසා "ආර්ථික ප්‍රතිප්‍රාප්තිය" විනාශවනු ඇතැයි කියමින් බ්‍රවුන් ඊට ප්‍රතිචාර දැක්වීය. මුදල් ඇමති ඇලිස්ටෙයා ඩාලිංගේ අයවැය ලේඛනය ඉදිරිපත් කරන්නේ මාර්තු 24 දිනය. යුරෝපා කොමිසම "වැරදි" බව ද කප්පාදුව ඉක්මනින් ක්‍රියාත්මක කිරීම ප්‍රතිප්‍රාප්තියට හානිකර වනු ඇතැයි ද ඔහු අවධාරනයෙන් කියා සිටියේය.

රටවල් හතකින් සමන්විත ප්‍රමුඛ කාර්මික ජාතීන්ගේ ජී 7 කන්ඩායම තුල වඩාත් තියුනු හා ඉක්මනින්ම ක්‍රියාවට නගන හිඟ අඩුකිරීමේ යෝජනා ඉදිරිපත් කර ඇත්තේ තමන් බවට උදම් අනන කම්කරු පක්ෂය, ඇත්ත වශයෙන්ම නම් කප්පාදු පියවර දැනටමත් ආකෘතියක් වශයෙන් ඉදිරිපත්කොට ඇතැයි කියා සිටියි. 2011 වසරින් ඇරඹෙන වසර තුල එයට පවුම් බිලියන 38 ක වියදම් කප්පාදුවක් ද අප්‍රේල් මාසයේ පටන් බිලියන 19 ක බදු වැඩිකිරීම් ද ඇතුලත් වේ. අමතර පියවර ගැනීමට ද තමන්ට අවශ්‍ය බව ආන්ඩුව ප්‍රකාශකර තිබේ. එහෙත් වඩා ඉක්මනින් පනවන කප්පාදු වැඩ සටහන් ආර්ථිකය පසුබෑමක් කරා ආපසු තල්ලු කරනු ඇතැයි ආන්ඩුව බියට පත්ව සිටියි. එංගලන්ත මහ බැංකුව ද ප්‍රමුඛ පෙලේ අර්ථශාස්ත්‍රඥයන් බොහොමයක් ද මෙම ස්ථාවරයේ පසුවෙති. දැන් ඉල්ලා සිටින පියවර ක්‍රියාත්මක කිරීමට ප්‍රතිඥා දුන හොත් කම්කරු පක්ෂය ඡන්දයෙන් පරාජය වනු ඇතැයි ද ආන්ඩුවට ඒත්තුගොස් තිබේ. එහෙත් මේවා උපායික වෙනස්කම් පමනි. ආර්ථික තත්වයන් තව දුරටත් නරක අතට හැරුනහොත් හෝ වඩා තීරනාත්මක පියවර ගත යුතු බවට කෙරෙන ඉල්ලීම් තව දුරටත් ඉහල නැංවුනහොත් කම්කරු පක්ෂය අපේක්ෂිත පරිදි කටයුතු කරනු ඇත.

ආන්ඩුවේ අනාවැකි පදනම්ව ඇත්තේ, ආර්ථික වර්ධනයෙන් ලැබෙනු ඇතැයි ගනන් බලා ඇති පවුම් බිලියන 25 මත යයි භාන්ඩාගාර ප්‍රධාන ලේකම් ලියම් බ්‍රවුන් සඳහන් කලේය. එය නොලැබුනහොත් යුරෝපා කොමිසම විසින් යෝජිත කප්පාදු කිරීම් පැනවිය යුතුව තිබේ.

එක්සත් රාජධානියේ ආර්ථිකය පවතින්නේ දුෂ්කර තත්වයකය. දේශීය හා ගෝලීය ආර්ථික තත්වය තවදුරටත් නරක අතට පෙරලෙනු ඇතැයි අපේක්ෂා කිරීමට හේතු එමටය.

සඵල වැටුප් කප්පාදුවක් ඇතුලුව, දිගටම පවතින ජීවන තත්වයන්ගේ පහත වැටීමක් කුටුම්භයන් විසින් අපේක්ෂා කලයුතු බවට එංගලන්ත බැංකුවේ ත්‍රයි මාසික නිවේදනය මේ සතියේ අනතුරු ඇඟවීය. විරැකියාව එහි මුදුනටම ලඟාවී ඇතැයි නිගමනය කිරීමට තවමත් කල් වැඩිය.

බොහෝ කම්කරුවෝ වැටුප් කප්පාදු හා අර්ධ කාලීන සේවයේ යෙදීම පිලිගෙන ඇත. එහෙත්, බැංකුව කියා සිටින්නේ වැටුප් වලට වඩා භාන්ඩ හා සේවා පිරිවැය තව දුරටත් වේගයෙන් නැඟීමට ඉඩ ඇතැයි යන්න ඔවුන් අබෝධ කරගත යුතු බවයි. වැටුප් වැඩිවීමේ වාර්ෂික අනුපාතය සියයට 1.4 ක්ව පවතී.

පෞද්ගලික අංශයේ අනුපාතිකය යන්තමින් සියයට 0.7 ක මට්ටමේ පවතියි. මෙය උද්ධමන වේගයට වඩා බොහෝ පහත් මට්ටමකි.

"පසුබෑම පැවති කාලය තුල වැටුප් වලට සීමා පැනවීම රැකියා බේරාගැනීමට සහායක් වූ අතර ප්‍රතිප්‍රාප්තියේ අවධිය තුල රැකියා අහිමි නොවීමට නම් මේ තත්වය තවත් සෑහෙන කාලයකට පැවතිය යුතු බවට දැල්වෙන අවබෝධය එක්සත් රාජධානියේ කම්කරුවන්ගේ හොඳහිත අන්තයටම උරගා බලනු ඇතැයි" වාර්තාව කියා සිටියි.

එහි තව දුරටත් මෙසේ ද සඳහන් වේ. "විරැකියාව තවදුරටත් පහත වැටීමේ අවදානමක් පවතියි. අනාගත ලාභ සීමාකිරීමකට ව්‍යාපාර ප්‍රතිචාරය දක්වනු ඇත්තේ සේවකයන් දොට්ට දැමීම මගින් ය."

ආර්ථිකය මේ වසරේ යලි පසුබෑමකට ඇද වැටෙනු ඇති බවට බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදක හා මුදල් ප්‍රතිපත්ති කමිටු සාමාජික කේට් බාකර් පිලිගත්තාය. මේ මතය පුනරුච්චාරනය කලේය. "රැකියා අඩු" ප්‍රතිපත්තියක් හෝ ඊටත් වඩා නරක "රැකියා අහිමි" ප්‍රතිප්‍රාප්තියක සම්භාවිතාව කලක සිට සීඅයිපීඩීයේ අවධානයට ලක්ව තිබූ බව පිරිස් හා සංවර්ධනය පිලිබඳ වරලත් ආයතනයේ (සීඅයිපීඩී) ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ ජෝන් ෆිල්පොට් ප්‍රකාශ කලේය.

නිල විරැකියාව 33,000 පහත වැටී ජනවාරි මාසය වන විට මිලියන 2.45 මට්ටමේ පැවතුනි. එය සියයට 7.8 විරැකියා මට්ටමකි. එහෙත් රැකියා අහිමි සංඛ්‍යාවේ පහත වැටීම එක්සත් රාජධානියේ සේවා නියුක්තියෙහි 14 වසරක පහතම අගය වසං කරන්නක් පමනි. මිලියන 8.16 ජනතාවක් "ආර්ථික වශයෙන් අක්‍රීය පුද්ගලයන් ලෙස දැන් වර්ගකොට ඇතැයි" ජාතික සංඛ්‍යාලේඛන පිලිබඳ කාර්යාලය තහවුරු කොට තිබේ. පූර්න වශයෙන් සෑම වැඩිහිටි පුද්ගලයින් 5 න් එක් අයෙක් තවදුරටත් රැකියා සොයා නොයයි.

දීර්ග කාලීන විරැකියාව 687,000 ක් දක්වා 61,000 න් ඉහල නැගුනි. තරුන විරැකියාව මිලියනයක්ව පවතින අතර අර්ධ කාලීන විරැකියාව ද මිලියනයක්ව පවතියි. රැකියා නොමැතිවීම හේතු කොට ගෙන අමතර 100,000 දෙනා යලි අධ්‍යාපනයට පිවිස තිබේ. මේ අනුව අධ්‍යාපනය ලබන්නන්ගේ සංඛ්‍යාව වාර්තාගත ඉහල මට්ටමක් වන මිලියන 2.3 කි.

මේ අනුව රැකියා අහිමි හෝ ආර්ථික වශයෙන් අක්‍රීය ජන සංඛ්‍යාව මිලියන 10.6 ක් හෝ ශ්‍රම හමුදාවෙන් සියයට 28 කි.

දැන් තවත් කප්පාදු ගෙනඑනු ලබන්නේ මෙම තත්වය යටතේය. ජෙරමි වෝනර් *ටෙලිග්‍රාෆ්* පත්‍රයේ මෙසේ ලිවීය. "ඡන්දය දිනය තෙක් වෙලඳපොලවල් සිය විනිශ්චය අත්හිටවනු ඇතැයි නොසිතන්න. ව්‍යවහාර මුදල් හා මූල්‍ය අර්බුද පැමිනි කල්හි ඒවා හදිසියේම හා වැඩි අනතුරු ඇඟවීමකින් තොරව ම වර්ධනය වේ. පෙරලිකාරිත්වයේ එම ස්ථානයට අප බොහෝ සෙයින් සමීපව සිටිනවා විය හැක."

දිගටම පවත්නා අර්බුදයේ ඔද්දල් ස්වභාවයෙහි වඩාත්ම විශේෂ ප්‍රකාශනය රාජ්‍ය නය සම්බන්ධයෙන් එක්සත් ජනපද නය වර්ගීකරන ආයතනයක් වන මූඩීස් වෙතින් පලවිය. "ආර්ථික ප්‍රතිප්‍රාප්තියේ පෙහොට්ටුව ම සිඳ දමන්නේ නැතිව එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රන්සය හා ස්පාඤ්ඤය රාජ්‍ය මූල්‍ය පාලනය කිරීම සඳහා දරන ප්‍රයත්නය අවදානම් ගමනක් ලෙස පෙනී යයි." මූඩිගේ විනිශ්චය නැවත *ටෙලිග්‍රාෆ්* පත්‍රයේ ඇම්බ්‍රෝස් එවන්ස් ප්‍රිචාඩ් විසින් ගෙනහැර දක්වා තිබුනි.

උත්තේජක පියවර කල්තියාම ඉවත්කර ගැනීම තුලින් ඇතිවියහැකි "ක්‍රියාත්මක කිරීමේ සෑහෙන අවදානම" ගැන මූඩී අනතුරු ඇඟවීය. ප්‍රමානාත්මක ලිහිල් කිරීම නය පිරිවැයෙන් පාදක ඒකක 40 සිට 100 දක්වා කපාහැර ඇති බව ජත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධ්‍යයනයකින් කියැවුනු බව ද මූඩී සඳහන් කරයි. එහෙත් වැඩි කලක් බලා සිටීම ද "අවදානම අඩු නොකරයි."

සිය කටයුතු පිලිබඳ විභව ගම්‍යයන් ගැන පාලක ප්‍රභුව සන්සුන් කරවන අවවාදාත්මක වදනකින් වාර්තාවේ ප්‍රධාන කර්තෘ පියර්රේ කැලෙටෝ සිය වාර්තාව අවසන් කලේය.

"ඒඒඒ වර්ගීකරනය හා සංගතවූ මට්ටම් වලදී නයෙහි ඔරොත්තු දීම සුරක්ෂිතව පවත්වාගෙන යාම සඳහා මූල්‍ය ගැලපුම් අනිවාර්යයෙන්ම අවශ්‍ය කෙරෙනු ඇත. මේ මූල්‍ය ගැලපුම්වල විශාලත්වය කෙතරම් විය හැකිද යත් ඇතැම් අවස්ථාවල දී ඒවා සමාජ බැඳීම් උරගා බලනු ඇත. අප කථා කරන්නේ විප්ලවය ගැන නොවේ. එහෙත් අර්බුදයේ බැරෑරුම්කම සමාජයේ දුබලතා හෙලිදරව් කරන වේදනාකාරී තෝරාගැනීම් වලට යාමට ආන්ඩු වලට බලකෙරෙනු ඇත."

© www.wsws.org